# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2022.10.13

වේලාව : පෙ.ව.9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මූලාසනය : **ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය (ප්‍රධාන ලේකම්)**

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | | |
|---|---|---|---|
| 01) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභාව(බ.ප) |
| 02) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප) |
| 03) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යංශය(බ.ප) |
| 04) | සිරිසෝම ලොකුවිතාන මහතා | - | ලේකම්,අධ්‍යාපන අමාත්‍යංශය(බ.ප) |
| 05) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යංශය(බ.ප) |
| 06) | ගාමිණී ධර්මසේන මහතා | - | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යංශය(බ.ප) |
| 07) | චන්දන රණවීර ආරච්චි මහතා | - | ලේකම්,කෘෂිකර්ම අමාත්‍යංශය(බ.ප) |
| 08) | ඩබ්ලිව්.එම්.දයාවතී මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 09) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 10) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 11) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 12) | ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය | - | වැ.බ. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 13) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 14) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රධාන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | කෘෂි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ගෙවතුවගා තරඟාවලිය පැවැත්වීම | මේ වන විට කොළඹ දිස්ත්‍රික්කයේ ගෙවතු 89250ක්, ගම්පහ දිස්ත්‍රික්කයේ ගෙවතු 85563ක් සහ කළුතර දිස්ත්‍රික්කයේ ගෙවතු 73482ක් වශයෙන් නිමා කර ඇති බවත්, ගෙවතු වගා තරඟාවලියට අදාළව විනිශ්චය කටයුතු මේ දිනවල සිදු කරමින් පවතින බවත්, ගෙවතු වගා කටයුතු සම්බන්ධයෙන් 85%ක පමණ ප්‍රගතියක් දක්නට ලැබෙන බවත්, කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>තවද පාසැල් ගෙවතු වගා තරඟාවලියට අදාළ විනිශ්චය කටයුතු ද මේ දිනවල සිදු කරමින් පවතින බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. ගෙවතු වගා කටයුතු සම්බන්ධයෙන් මේ දක්වා ප්‍රගතිය පිළිබඳ ප්‍රධාන ලේකම් විසින් තොරතුරු විමසා සිටි අතර, ඊට අදාළ ප්‍රගතිය ලබා දීමට කටයුතු කරන බවට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව රැස්වීමේදී සාකච්ඡා කරන ලද කටයුතු සම්බන්ධයෙන් වන ප්‍රගතියද ඉදිරි රැස්වීම් වලදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසට ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br><br>එමෙන්ම මේ වන විට වගා කටයුතු ආරම්භ කිරීමේ අරමුණින් ශුද්ධ පවිත්‍ර කිරීමට කටයුතු කර ඇති කොරතොට ප්‍රදේශයේ පිහිටි ඉඩමේ කටයුතු වන විට නිම කරමින් පවතින බවත්, මේ සඳහා ගත කරන ලද කාලය සම්බන්ධව සෑහීමකට පත්විය නොහැකි බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ලබන සතිය වන විට එම කටයුතු නිමකරන ලෙස ප්‍රාදේශීය ඉංජිනේරු බත්තරමුල්ල වෙත දැනුම් දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, කෘෂි කර්ම/ අධ්‍යාපන අමාත්‍යාංශ<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්/ පාලන) |
| 02. | We green වෙළඳ සැල පවත්වාගෙන යාමේ කටයුතු සම්බන්ධව | මෙම වෙළඳ සැලේ අලෙවිය සඳහා යොදා ගත් එළවළු සහ පළතුරු වර්ග ගෙවතු වලින් හා ගොවීම් මධ්‍යස්ථාන වලින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාහනයක් මඟින් වෙළඳසැල වෙත ප්‍රවාහනය කිරීමට කටයුතු කළ නමුත් පවතින ප්‍රවාහන දුෂ්කරතා මත මේ වන විට එය සිදු කිරීමේ අපහසුතාවයක් පවතින බවට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>මෙම වෙළඳ සැල පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට කටයුතු කල යුතු බවට සාකච්ඡා වූ අතර, ඒ අනුව ගෙවතු වගා කටයුතු පවත්වාගෙන යන නිලධාරීන් එම ගෙවතුවල පවතින භෝග වර්ග මෙම වෙළඳ සැලෙහි අලෙවි කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. | ලේකම්, කෘෂි කර්ම අමාත්‍යාංශ |

| | | | |
|---|---|---|---|
| 03 | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය නව ගොඩනැගිල්ලට ස්ථාන ගත කිරීම සම්බන්ධව | මේ සම්බන්ධව ප්‍රගතිය සාකච්ඡා කිරීමේදී දැනට කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙක් නව ගොඩනැගිල්ලට ගොස් ඇති බවත්, වැසිකිළි පද්ධතිය සම්බන්ධයෙන් පවතින ගැටළුව මත අනිකුත් කාර්ය මණ්ඩලය කොටසක් රැඳී සිටින බවත්, පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව වෙන් කරන ලද මුදල් වලින් වැසිකිළි පද්ධතිය සාදා නිමකර ඇති නමුත් ඒ සඳහා අවශ්‍ය වැසිකිළි වලවල් විධිමත් පරිදි සකස් කිරීමට එම භූමියේ පවතින තත්වය මත අපහසු වී ඇති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු දක්වන ලදී.<br><br>ඒ සඳහා සිදුකල හැකි පිළියමක් සම්බන්ධව සාකච්ඡා කළ අතර, ඉදිරිපත් වී ඇති විසඳුම් සම්බන්ධව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. නව ව්‍යාපෘති ආරම්භ කිරීම මේ වන විට නවතා ඇති නමුත් මෙය සිදු කරමින් පවතින ව්‍යාපෘතියක් වන බැවින් දැනට පවතින ප්‍රතිපාදන යොදවා මෙම ව්‍යාපෘතිය ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය |
| 04 | නඩත්තු කටයුතු සඳහා වෙන්කළ ප්‍රතිපාදන වැයකිරීම සම්බන්ධව | පළාත් සභා නඩත්තු කටයුතු සම්බන්ධව වෙන් කර ඇති රුපියල් මිලියන 1553ක මුදල් වැය කිරීම සම්බන්ධව ප්‍රගතිය තමා වෙත ලබා දීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br><br>නවද සංවර්ධන ප්‍රගතිය සම්බන්ධව අභ්‍යන්තර රැස්වීම් පැවැත්වීම හා එහි ප්‍රගතිය ලබා ගැනීමේ කටයුතු නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින්ම සිදු නොකර ඒ සඳහා වගකීම වෙනත් මාණ්ඩලික නිලධාරියෙකු වෙත පවරා අදාළ තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 05. | වැසිකිළි පද්ධතියේ භාවිතාවන උපකරණ අස්ථානගත වීම සම්බන්ධව | පළාත් සභා ගොඩනැගිල්ල තුළ එක් එක් මහල් සඳහා සකස් කර ඇති වැසිකිළිවල පවතින අඩුපාඩු නිරන්තරයෙන් පිළිසකර කළත් ඒවායේ භාවිතා වන උපකරණ බොහෝ අවස්ථාවල අස්ථාන ගත වීමේ ගැටළුවක් පැන නැගී ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව පළාත් සභා ගොඩනැගිල්ලේ පවතින ආයතන වල බඩු බාහිරාදිය අස්ථාන ගත වීමක් සිදුවුනොත් සිදුවන අලාභය ආරක්ෂක අංශයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ප්‍රධාන ලේකම්ගේ අත්සනින් යුතුව ආරක්ෂක අංශයේ මෙහෙයුම් කළමනාකරු වෙත ලිපියක් යැවීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු/ පාලන) |

| | | | |
|---|---|---|---|
| 06. | පරිගණක අළුත් වැඩියා කිරීමෙන් පසු ඉවත් කරන කොටස් ගබඩාවකට යොමු කිරීම සම්බන්ධව | තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මඟින් පරිගණක අළුත් වැඩියා කිරීමේදී ඉවත් කරන කොටස් සම්බන්ධයෙන් යම් අක්‍රමිකතාවක් සිදුවීම වැළැක්වීම සඳහා විනිවිද භාවයක් ඇතිව එම ඉවත් කරන කොටස් සම්බන්ධව ක්‍රියා කළ යුතු බවටත්, ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ගන්නා ලෙසටත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූලය ) |
| 07. | ලේකම්වරුන් වෙත පැවරී ඇති රාජකාරි කටයුතු අප්‍රමාදව සිදු කිරීම සම්බන්ධව | එක් එක් අමාත්‍යාංශ මට්ටමින් ලේකම්වරුන් වෙත පැවරී ඇති වගකීම් සම්බන්ධව අනලස්ව, අප්‍රමාදව කටයුතු කිරීම සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් සියලුම ලේකම්වරු වෙත අවධාරණය කරන ලදී.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින්ද මේ සම්බන්ධව තමන් දැනුවත් කර ඇති අතර, ඒ අනුව රාජකාරී කටයුතු සම්බන්ධව අඩුපාඩු ඇති නොවන පරිදි අමාත්‍යාංශවල කටයුතු සංවිධානගත කර ගන්නා ලෙසත්, නිතර කාර්යාලය තුළ රැඳී සිටීමටත්, බැහැර වන අවස්ථාවලදී වගකීම් සහිත මාණ්ඩලික නිලධාරියෙකු දැනුවත් කර අදාළ රාජකාරි පැවරීමට කටයුතු කරන ලෙසත්, මනා මහජන සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br><br>අධිකාරිවල කටයුතු සිදු කිරීමේදී අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ ප්‍රමාදයන් ඒ ඒ පද්ධතිවල ක්‍රියාදාමයන්ට තදබල ලෙස බලපෑම් ඇතිවන බවට අධිකාරීන් විසින් කරුණු වාර්තාකර ඇති බැවින්, එම ආයතනවලට උපරිම සහාය ලබා දෙන ලෙස දන්වන ලදී. තවද අමාත්‍යාංශ යටතේ පවතින සියලුම දෙපාර්තමේන්තු, අධිකාරි සහ සියලුම ආයතනවල කාර්යසාධනයට අමාත්‍යාංශ ලේකම්වරයාගේ මැදිහත් වීම සෘජුව බලපාන අතර, එම ආයතනවල නිලධාරින්ගේ අකාර්යක්ෂමතාවයට එම අමාත්‍යාංශ ලේකම්වරයා වගකිව යුතු බවට ප්‍රධාන ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br><br>රටේ පවතින වාතාවරණය මත සියළුම අමාත්‍යාංශවල කටයුතු මන්දගාමී තත්වයට පත්වූ නමුත් මේ වන විට පත්ව ඇති තත්වය මත මහජන ක්‍රියාකාරකම් හා තමාගේ වගකීම යටතේ පවතින සියළුම සේවා කටයුතු අප්‍රමාදව ඉටු කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී.<br><br>එමෙන්ම ඇතැම් ලේකම්වරුන් තුළ තම රාජකාරියට අදාළ වගකීම් පිළිබඳ අවබෝධය ඉතාම අඩු තත්වයක් පෙන්නුම් කරන අතර, තමන්ගේ බල සීමාව තුළ තමන්ගේ තනතුරට අදාළ කර්තව්‍ය සම්බන්ධව වගකීමෙන් ක්‍රියා කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 08. | බස්නාහිර පළාත් ආහාර සුරක්ෂිතතා වැඩසටහන සම්බන්ධව | රටේ පවතින තත්වය මත සියළුම දෙනාට සම පෝෂණයක් ඇති කිරීම සඳහා ආහාර සුරක්ෂිතතාව පිළිබඳ පූර්ව සූදානමක් ඇති කිරීමට ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වන ලදී. ඒ අනුව ආණ්ඩුකාරතුමාගේ සහභාගිත්වයෙන් ආහාර සුරක්ෂිතතා මෙහෙයුම් කමිටුවක් ඇති කිරීමට එම ප්‍රවර්ධන වැඩ සටහනේදී සාකච්ඡා කළ නමුත් මේ වන විටත් නිලධාරීන් නම් කර නොමැති අතර, අද දින (2022.10.13) ප.ව.12.00 වන විට කමිටු සාමාජිකයින් නම් කර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත තමා විසින් යොමු කරන බවට ප්‍රකාශ කරන ලදී.<br><br>සෑම කෙනෙකුටම සම පෝෂණ තත්වයක් ඇතිවන පරිදි ආහාරවලට ප්‍රවේශයක් ඇති කරලන්නේ කෙසේද යන්න ආහාර සුරක්ෂිතතාවයේ බලාපොරොත්තුව වේ. ඒ අනුව ඇතැම් පළාත්වල ආහාර අතිරික්තයක් පවතින අතර, ඇතැම් පළාත්වල ආහාර හිඟයක් පවතී. ඒ අනුව සියළු දෙනාටම සම පෝෂණයක් ලබා දීමට පියවර ගත යුතුය. ජනතාව වගා කටයුතු සඳහා යොමු කිරීමට, කෘෂි ව්‍යාපෘති යටතේ ජනතා දායකත්වයක් ලබා ගැනීමට කෘෂි ක්‍රමවේදයන් සකස් කර ගැනීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ පෝෂණවේදය සම්බන්ධයෙන් විශේෂ වැඩසටහනක් පැවැත්වීම සම්බන්ධවද සාකච්ඡා කරන ලදී.<br><br>මේ සමඟම පළාත් සභා අමාත්‍යාංශ හා වෙනත් ආයතනවලද පවතින ආර්ථික අර්බුදය මත ගැටළු පැන නැගී ඇති නිලධාරින් සිටින බැවින් ඒ සඳහා ද යම් ක්‍රියාමාර්ගයක් ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳවද ප්‍රධාන ලේකම් විසින් අවධානය යොමු කරවන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 09. | ප්‍රසම්පාදන ක්‍රමවේදය සම්බන්ධව | ප්‍රසම්පාදන ක්‍රමවේදයන් වෙනස් කිරීම පිළිබඳ නිරන්තරයෙන් විවිධ අමාත්‍යාංශ වෙතින් ඉල්ලීම් ඉදිරිපත් වන බවත්, ප්‍රසම්පාදන ක්‍රමවේදයන් වියදම් චක්‍රලේඛ වලට අනුගතව තව දුරටත් ක්‍රියාත්මක වන බවත් ප්‍රධාන ලේකම් පැහැදිලි කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 10. | රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධව | ජලය, විදුලිය ආදී පොදු පහසුකම් සම්බන්ධයෙන් අවම පිරිවැයක් දැරීමට හැකිවන පරිදි කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 11. | ණය ගෙවීම් සිදු කිරීම සම්බන්ධ ප්‍රමාදයන් | නිලධාරීන් විසින් ඉල්ලුම් කරන ලද ආපදා ණය ලබා දීමේදී සිදුවන ප්‍රමාදයන් පිළිබඳ තමා වෙත වාර්තා වී ඇති බවත්, ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 12. | ගොඩනැගිල්ලේ සවිකර ඇති වායු නැවුම්කාරක (air freshener) සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ කාර්යාලවල හා වැසිකිළි පද්ධති තුළ සවිකර ඇති වායු නැවුම්කාරක (air freshener) සුවඳක් වහනය වීමක් සිදු නොවන බවත්, ඒවාට විශාල මුදලක් ගෙවීම අනවශ්‍ය වන බැවින් තව දුරටත් එම බෝතල් යොදා ගැනීමට අවශ්‍යද යන වග සොයා බලන ලෙසත්, එවා අවශ්‍ය නොවන්නේ නම් ඒවා නැවත ලබා නොගැනීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.